සංශෝධනයයි

**රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය**

කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2019 (2020)

අංක 2185 දරන 2020 ජූලි මස 17 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද '' කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය - 2019 (2020)'' විභාග නිවේදනයේ, 8.0 යෝග්‍යතාව ඡේදයෙහි (ii) කොටස, (iii) කොටසෙහි සටහන සහ (vi) කොටස පහත සඳහන් පරිදි සංශෝධනය කෙරේ.

8.0 ***යෝග්‍යතාවය:-***

(ii) අයදුම්පත් කැඳවන අවසාන දිනට ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතු අතර ඒ බව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය. එසේම අයදුම්කරු අයදුම්පත් කැඳවන අවසාන දිනට රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

(iii) ***සටහන :***
2001.11.26 වැනි දිනට පෙර සේවයේ ස්ථිර කර ඇති අයදුම්පත් කැඳවීමේ අවසාන දිනයට වසර 18ක සක්‍රීය සේවා කාලයක් සපුරා ඇති සහ මෙම නිවේදනයේ 8.2 ඡේදයෙන් අපේක්ෂිත සුදුසුකම් සම්පූර්ණ කර ඇති ප්‍රාථමික මට්ටමේ PL කාණ්ඩයේ වැටුප් කේත යටතේ වැටුප් ලබන සියලුම නිලධාරීන්ට මෙම විභාගයට පෙනී සිටීමට අනුගාමී විභාග අවස්ථා දෙකක් ලබා දීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කර ඇති බැවින් එම සුදුසුකම් සපුරා ඇති PL කාණ්ඩය යටතේ වැටුප් ලබන නිලධාරීන්ට ද මෙම විභාගයට අයදුම් කළ හැක.

(vi) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් 2020 සැප්තැම්බර් මස 28 වැනි දිනට සම්පූර්ණ කර තිබිය යුතුය.

02. එම *ගැසට් නිවේදනයේ* සඳහන් අනෙකුත් විධිවිධාන එලෙසින් ම බලපැවැත්වෙන අතර මෙම සංශෝධනය හේතුවෙන් අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනය 2020.09.28 තෙක් දීර්ඝ කරනු ලැබේ.

03. මේ වන විටත් මෙම විභාගය සඳහා අයදුම්කර ඇති නිලධාරීන් මෙම සංශෝධනය හේතුවෙන් නැවතත් අයදුම්පත් යොමු නොකරන ලෙස නිවේදනය කරනු ලැබේ.

එස්. ආලෝකබණ්ඩාර,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්,
රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත්
පාලන අමාත්‍යාංශය.

2020 සැප්තැම්බර් මස 04 වැනි දින,
රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.